
රළ

විප්ලවයේ නිදහස උදෙසා කලාව!
කලාවේ පරිපූර්ණ නිදහස උදෙසා විප්ලවය!


කලා - සංස්කෘතික අතිරේකය

2025 පෙබරවාරි - මාර්තු

# 'රළ, කෘතිය ජනගත කිරීම'









පෙබරවාරි 06 වැනිදා කොළඹ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මණ්ඩල ශ්‍රවණාගාරයේදී 'රළ සාහිත්‍ය කලා විමර්ශන' කෘතිය ජනගත කෙරුණු අවස්ථාවේ අදහස් දැක්වීමෙන් දායක වූයේ අජිත් කුමාරසිරි, බූපති නලින් වික්‍රමගේ, පුබුදු ජයගොඩ යන සහෝදරවරු සහ අනෝමා රාජකරුණා සහෝදරිය. එහිදී ඔවුන් පළ කළ අදහස්වලින් උපුටා ගත් කොටස් මෙහි සටහන් කරමු.

## ජාතික ආත්මය සහ සංගීත සංඛ්‍යාත

**- අජිත් කුමාරසිරි**

'රළ සාහිත්‍ය කලා විමර්ශන' කියන මේ පොතේ සංගීතය ගැන දකින විදිය අනුව සංගීත සම්ප්‍රදාය වෙනුවට සංගීතමය සම්මුති ගත වීම කියන නම මම යෝජනා කරනවා. සම්මුතිගතවීම් තුළ එක්තරා විදියකට උරුමයන් ගොඩනැගෙනවා. ඒක තුළ අපි ජාතික ආත්මය හොයා ගන්නේ කොහොමද?

අද දේශපාලන කලාකරුවෝ විකල්පය පැත්තක තියලා අධිකාරී බලය ලත් කලාවකට යොමු වෙලා තියනවා. ඒ පරස්පරය විසඳගන්න ඕන. අපි උරුමයන් කළමනාකරණය කරද්දි එය නැවත විභාග කර බැලීම අත්‍යාවශ්‍යයි. විශේෂයෙන් ඉන්දියානු සංගීත සහ කලා මැදිහත් වීම අපිට විශේෂ බලපෑමක් කරනවා. දේශපාලන ආර්ථිකයේදී අපිට ඒක මගහැර යන්න බෑ.

1939 වගේ කාලෙන් පස්සේ ශබ්ද දේශපාලනය විශේෂයෙන් භාවිතාවට ආවා. නමුත් අපේ රට තවමත් ඒ උද්ඝෝෂණය අල්ලගෙන නෑ. අපි අද කතා කරන මේ විචාර ලිපි ඇතුළත් පොත තුළ සංගීත විෂය ගැන කියවාග න්න පුලුවන් ලිපි තුනක් තියනවා. දැන් රාණි ෆිල්ම් එක ආවා. ඒකෙ සරවනමුත්තුගේ හෘද සාක්ෂිය නිරූපණය කරන්නේ 'යසෝදරාවත' තුළින්. අපි දැන්වත් මේ බාබාලා හුරතල් කරන එක නවත්වමු. ඥාන විභාගයේදී සහ භාවිතයේදී ආස්වාද ගබඩාව දෙතැනක තියාගන්න වාම දේශපාලනය වෙනුවට විකල්ප කලා ධාරාවක් සොයා ගැනීමට දැන්වත් අපි කටයුතු කරමු.

## කලා විචාර සහ ස්ත්‍රී දෘෂ්ටිකෝණය

**- අනෝමා රාජකරුණා**

'රළ සාහිත්‍ය කලා විමර්ශන' කෘතියේ සිනමාව සම්බන්ධ ලිපි පෙළ තමයි මූලික වශයෙන් මම ආශ්‍රය කරගන්නේ. ලෙස්ටර් ජේම්ස් පීරිස්ගේ ඉඳලා ජගත් මනුවර්ණ දක්වා සිනමාකරුවන් ගැන් මේ කෘතියෙදි කතාකරනවා. මේ ලිපි කියෙව්වාම ස්ත්‍රියක් විදිහට මට ඇති වූ හැඟීමක් තියෙනවා. වම සහ 'රළ' කියන වචන දෙක ඇහෙද්දී ඒ නාමකරණ ඇතුලේ දිපු ඉඟිවලට සාපේක්ෂව 'වම' සහ 'රළ' අපිට හඟවන්නේ මොනවාද ? 2004ට පෙර අපි රැල්ල පැගුව හැඟීමට වඩා සුනාමියෙන් පස්සේ අපි හඳුනා ගත් 'රළ' පිළිබඳ හැඟීම වෙනස්. අද මෙතනට ආවාම රැල්ල පිළිබඳ හැඟීමට වඩා හැඟීමක් 'රළ' අරගෙන එනවාද කියල අපි හොයාගන්න ඕන. 'රළ' කියන්නේ අපි පත්තර ලෑල්ලට ගිහිල්ලා මිලදී ගන්න ප්‍රකාශනයක් නෙවෙයි. 'රළ' අපිට කියවන්න ලැබුණේ අඩුවෙන් එය සාමූහික ප්‍රයත්නයක ප්‍රතිඵලයක්.

නමුත් ඒ සමූහය ඇතුලේ ස්ත්‍රීන් හිටියෙ නැද්ද කියන සැකය මට ආවා. මං මේ කියන්නේ ස්ත්‍රීවාදීන් ගැන නෙවෙයි. ස්ත්‍රීන් ගැන. 'රළ' කතාකරන සිනමාව තුළ ස්ත්‍රීවාදී දැක්මක් නෙවෙයි තියෙන්නේ. සමස්ත ස්ත්‍රීන් එක මිටට ගෙන පැත්තකින් තියන විචාරයක් තමයි මට දකින්න තියෙන්නේ. මේ කෘතියේ ධනවාදය 'නූතන ජාතික රාජ්‍ය', 'අපරාධ රාජ්‍ය' වැනි බරපතළ මාතෘකා ගැඹුරින් කතා කරනවා. නමුත් මෙහි ස්ත්‍රිය පිළිබඳ කරන විස්තරය ගැන සෑහීමකට පත් වෙන්න බෑ. 'රළ' ලේඛක කණ්ඩායමට මම යෝජනා කරනවා කුමාරි ජයවර්ධන පවා යෝජනා කරන ආකාරයට සිනමා විචාරයේදී පැත්තකට දාලා තියෙන ස්ත්‍රී ඇස එළියට ගන්න කියලා. ස්ත්‍රිය ස්ත්‍රියක් වීම නිසා මුහුණ දෙන ප්‍රශ්නය එලියට ගන්න පුලුවන් වෙන්නේ එහෙම විචාරයකට විතරයි.

## කලා විචාරයේදී වමට තියෙන්නෙ ස්ටාලින්වාදයේ ආභාෂයක් !

**- භූපති නලින් වික්‍රමගේ**

කලාව සහ දේශපාලනය හා කරන්න පුලුවන් වෙන්නේ විමුක්තිය කියන තැනදි තමයි. ආත්මීය විමුක්තිය සහ සමාජයීය විමුක්තිය වශයෙන් එහි දෙකොටසක් තියනවා. දේශපාලන කලාව එක දශමයකින් හරි ගැස්සුනොත් අපි ගිහින් නවතින්නේ ප්‍රචාරකවාදී කලාවක් ඇතුලේ. කාන්ට් කලාව හැඳින්වුවේ අරමුණකින් තොර අරමුණුසහගතභාවයක් හැටියට.

ලංකාවේ විවිධ කලා විචාර ගුරුකුල තියනවා. යුරෝපීය යථාර්ථවාදය තුළ ආවා අදහසක්, 'ජේන දේ අඳින්න පුලුවන් ද?' කියන ප්‍රශ්නය එක්ක. ඒ විදිහේ ධාරාවන්ගෙන් පැහැදිලිව වෙන් වූ වාම විචාර ධාරාවක් ලංකාවේ තියනවා. හරි හෝ වැරදි හෝ වමට කලාව තුළ බලයක් තියනවා. ලංකාවේ වමේ කලාවේ නෛසර්ගික ගුණයක් තමයි ආකෘතිවාදයට එරෙහි අන්තර්ගතය. ආකෘති හරඹ කරන ආකෘතිවාදියෝ මේක ඇතුලේ ඉර ගහලා පැත්තකට වෙන් කරනවා.


වමේ කලාව කියන සංකල්පයට කලින් තමයි බොල්ෂෙවික් කලාව කියන ව්‍යවහාරය ආවේ. 1910 මේ ගොල්ලෝ අභියෝග කළා 'ගුඩ් ටේස්ට්' එකට. 'රළ' පොතේ 'ග්ලැඩියේටර් ප්‍රේමය' හඳුන්වන්නෙ ඉහළ මට්ටමේ නාට්‍යයක් වශයෙන්. හැබැයි බොල්ෂෙවික් කලාව ආවේ ඉහළ මට්ටමේ කලාව සහ පහළ මට්ටමේ කලාව කියන බෙදීමට විරුද්ධව. මුළු ලංකාවේම වමේ කලාවේ තියෙන අවුලක් මේක. දැඩි

**4 පිටුවට**





## 'රළ සාහිත්‍ය කලා විමර්ශන' කෘතිය



නවකතා, කෙටිකතා, කාව්‍ය, නාට්‍ය, චිත්‍රපට හා සංගීත විචාර රැගත් කෘතියක් ලෙස, 'රළ සාහිත්‍ය කලා විමර්ශන' කෘතිය පසුගිය 6 වැනිදා කොළඹ පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල ශ්‍රවණාගාරයේදී ජනගත කරන ලදී. වසර ගණනක් පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ මධ්‍යම පුවත්පත වන 'වම' සමග බෙදාහරින කලා සංස්කෘතික අතිරේකයෙහි පළ කෙරුණු විචාර ලිපි ගණනාවකින් තෝරාගත් විචාරාත්මක ලිපි 32ක් මෙම කෘතියට ඇතුළත්ය.

ලෝකයේ විමුක්තිකාමී මිනිස් මැදිහත්වීම් සතු උරුමය දරා ගනිමින් සමසමාජ ව්‍යාපාරයේ සිට මෙරට ප්‍රගතිශීලී කලා සංස්කෘතික පෙළ ගැස්මක් පැවැති බව අපි දනිමු. එහෙත් මේ වනවිට සාහිත්‍ය කලා ක්ෂේත්‍රය, කලා විචාරය පසුබස්වමින් වෙළෙඳපොළ චින්තනය මෙන්ම ජාතිකවාදී මන්තරය මගින් විනාශයේ ගමන පණ ගන්වා ඇත.

එහිදී වඩා යහපත් ලෝකයක් වෙනුවෙන් කලා නිර්මාණයේ යෙදෙන, කිසිදු ලාභ ප්‍රයෝජනයක් නොතකා මිනිස් සිතීම වඩා පොහොසත්, වඩා ඉදිරිගාමී ආස්ථානයකට කැඳවීම වෙනුවෙන් වැඩකරන කලාකරුවන්, රසික-සහෘද ප්‍රජාව, විචාරකයන් එක් අරමුණක සිට වැඩ කළ යුතු වෙයි. එවැනි පොදු අරමුණක් වෙනුවෙන් මිනිස් සමාජය කැඳවීමේදී පොදු සිතීම පුළුල් කළ යුතුවා මෙන්ම සිතීමේ දිශානතියක් නිර්ණය කළ යුතුව ඇත. කලානිර්මාණ බිහි කිරීම, සහෘද රසවින්දනය මෙන්ම කලා විචාරය වඩ වඩාත් ජනතාව වෙත සමීප කළ යුතු ඒ නිසාය.

වසර කිහිපයක් තුළ බිහි වූ කලා නිර්මාණ පදනම් කර ගෙන 'රළ' කලා සංස්කෘතික අතිරේකය තුළ පළ කෙරුණු විචාරාත්මක සටහන් අතුරින් තෝරාගත් ලිපි එකතුවක්, 'රළ සාහිත්‍ය කලා විමර්ශන' නමින් කෘතියක් ලෙස මුද්‍රණ ද්වාරයෙන් ජනගත කෙරෙන්නේ එකී අවශ්‍යතාව සපුරාලීමේ අරමුණෙනි.